Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව

විෂය - නර්තනය

සතිය-2021-05-17- 2021-05-21

ශ්‍රේණිය 12

**Prepared by-** P.L. ASHA NISHANTHI

නිපුණතාව 06 නර්තන කලාව හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුමය රැක ගැනීම සඳහා ක්‍රියා කරයි.

නිපුණතා මට්ටම 6.04 දේශීය නර්තන සම්ප්‍රදායන්ට අයත් නිර්දේශිත ශාන්තිකර්ම පිලිබඳ තොරතුරු විමසුමට ලක් කරයි.

ක්‍රියාකාරකම බලි ශාන්තිකර්මය.

**<u>නිවැරිදි පිළිතුර තෝරන්න.</u>**

1.බලි ශාන්තිකර්මයට අදාළ ගායනා අතර හිසේ සිට පාදාන්තය පිලිබඳ කියවෙන කවි වන්නේ
1. නමස්කාර කවි 2.සිරසපාද කවි 3. කඩතුරා කවි 4.ජයමංගල කවි

2. මිනිසාගේ පරම ආයුෂ අවුරුදු 120 ක් ලෙස සලකා ජෝතිෂ්‍ය අනුව එම කාලය බෙදා ඇත්තේ
1.මිනිසුන් අතර 2. ග්‍රහයන් අතර 3.ජෝතිෂ්‍යන් අතර 4. දෙවියන් අතර

3.බලි ශාන්තිකර්මයන් දැකිය හැකි වන්නේ
1.උඩරට නර්තන සම්ප්‍රදායේ 2.නුවර කලාවියේ 3. පහතරට සම්ප්‍රදායේ 4. සම්ප්‍රදායන් තුනෙහිම

4. **බලියාග** පිලිබඳ කෘතිය රචනා කර ඇත්තේ
1.තිස්ස කාරියවසම් මහතා 2. මුදියන්සේ දිසානායක මහතා
3. ජයසේන කොට්ටේගොඩ මහතා 4.ලයනල් බෙන්තරගේ මහතා

5. බුද ග්‍රහයාට අයත් විමානය වන්නේ
1.කොළොන් 2. කොහොඹ 3.කෙසෙල් 4. වැටකේ

**<u>හිස්තැන් සදහා සුදුසු පිළිතුරු ලියන්න.</u>**

6.<u>**නිරිත කොන යුතා මල්මල් සුවදැති වැටකේ වන වෙතා**</u> මෙය ---------- ග්‍රහයාට අයත් කවියකි .

7.<u>**රන් සිරි වස**</u> අතදරා සිටින්නේ ---------ග්‍රහයයි.

8.පංච බලි අතර ඥාති බලි රාජ බලි ප්‍රේත බලි --------- හා ----------- දක්නට ඇත.

9.අභිදානප්ප දීපිකාවේ කපුටා හඳුන් වන්නේ -------------- යනු වෙනි.

10. <u>**රංචාමර**</u> සුරත දරන්නේ -----------ග්‍රහයා වන අතර එයට හිමි වාහනය --------------- යි.

**<u>ප්‍රශ්ණ සියල්ලටම පිළිතුරු සපයන්න.</u>**

11. බලි ශාන්තිකර්මයට අයත් ගායනා නම් කරන්න .

12 . බලි ශාන්තකර්මයේ රංග උපකරණ හා සැරසිළි පිලිබදව අදහස් දක්වන්න.

13.මෙම ශාන්තිකර්මයේ රංග වස්ත්‍රභරණ පිළිබදව විස්තර කරන්න.

14 බලි ශාන්තිකර්මය සංරක්ෂණය කිරිමට ගත යුතු පියවර මොනවාද?